ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
අනගාරික ධර්මපාල මාවත, දෙහිවල.
தேசிய மிருகக் காட்சிச்சாலைத் திணைக்களம்
அனகாரிக தர்மபால மாவத்தை, தெஹிவளை.
THE DEPARTMENT OF NATIONAL ZOOLOGICAL GARDENS
Anagarika Dharmapala Mawatha, Dehiwala, Sri Lanka.

මගේ අංකය / எமது இல. / My No. DZG/DZ/03/05/11
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023.02.09

අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05

මහත්මයාණෙනි,

**"සතුන් සමඟ සෙනෙහසේ සතිය"**

දෙහිවල සත්වෝද්‍යානය දේශීය හා විදේශීය සත්ත්ව ලෝලීන් අතර ඉතා ජනප්‍රිය ස්ථානයක් වේ. එමෙන්ම අප සත්වෝද්‍යානය තුළ ආදරයෙන් රැකබලා ගන්නා සතුන් හට ආදරය, කරුණාව තවදුරටත් ලබාදීමට 2023.02.11 දින සිට පුරා සතියක් මහජනතාවට අවස්ථාව සලසා දී ඇත.

මේ සඳහා දෙහිවල ජාතික සත්වෝද්‍යානය විවිධ විශේෂාංග රැසක් සංවිධානය කර ඇත. ඒ සියලුම අංගයන් සඳහා සත්වෝද්‍යානය නැරඹීමට පැමිණෙන සියළු දෙනාටම සහභාගි විය හැකි පරිදි සූදානම් කර ඇත.

- මෙම සතිය තුලදී දෙහිවල සත්වෝද්‍යානය ඇතුළු අනිකුත් අනුබද්ධ ආයතන නැරඹීම සඳහා වසරකට කිහිපවාරයක් පැමිණෙන නරඹන්නන් හට විශේෂ සාමාජික කාඩ් පතක් ලබාදීමට සැලසුම් කර ඇත.
- මේ අතර සතුන්ට ආහාර ලබා දීමට අවස්ථාවන්
- සතුන් සමග ඡායාරූප ගැනීමට විශේෂ ස්ථාන
- නරඹන්නන් සඳහා විවිධ තරඟයන් ආදී විශේෂාංග පැවැත්වීමට නියමිත වේ.
- සතුන් පිළිබඳ විශේෂ ආදරයක් ඇති අය සඳහාම සැකසුණු සත්ව සවිය හා කැපකරු මාපිය වැඩසටහන් සඳහා ද මෙහිදී ජනතාවට දායක වීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

විශේෂයෙන්ම මෙම දිනය විචිත්‍රවත් කිරීම සඳහා මාධ්‍ය දායකත්වය ලබාදීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මේ පිළිබඳ වැඩි විස්තර 0715601757 යන දුරකතන අංකය ඔස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා දිනූෂිකා මානවඩු මෙනවිය හෝ 0714450626 යන දුරකතන අංකය ඔස්සේ සංවර්ධන නිලධාරී ශාමල් සමරනායක මහතා යන අය සම්බන්ධීකරණය කර ගැනීමෙන් ලබාගත හැකි බව කාරුණිකව දන්වා සිටින අතර විශේෂයෙන්ම මෙවැනි වැඩසටහන් සාර්ථක කරගැනීම සඳහා නිරන්තරයෙන්ම ඔබ ආයතනය ලබාදෙන ප්‍රචාරක අනුග්‍රහය අගය කොට සලකමි.

මෙයට විශ්වාසී,

ආචාර්ය තිලක් ප්‍රේමකාන්ත
අධ්‍යක්ෂ ජනරාල්



CamScanner